**2022 වර්ෂය තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ ඩිජිටල් පරිවර්ථන ක්‍රියාවලියට සමගාමීව සිදු කරන ලද කාර්යයන්**

1. කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයෙකුට සිය රැකියාව සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි කළමනාකරණ පද්ධතිය (https://cms.labourdept.gov.lk) මගින් මාර්ගගතව ඉදිරිපත් කිරීමට 2022.03.15 දින සිට පහසුකම් සලසා ඇත.
2. සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ අයදුම්පත් භාරදීම සඳහා සහ සේවායෝජක ලියාපදිංචි කිරීම් සඳහා පැමිණෙන සේවාලාභීන්ගේ පහසුව උදෙසා සකස් කරන ලද 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' (EPF Appointment Management System) 2022.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 1958 අංකය ඇමතීමෙන් හෝ appointment.labourdept.gov.lk යොමුව මගින් අදාල කම්කරු කාර්යාල වෙතින් අවශ්‍ය සේවාව ලබා ගැනීම සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කර ගත හැකිය. මෙමගින් සේවාදායකයින්ට කාලය අපතේ යැවීමකින් තොරව නිශ්චිත වේලාවකදී සේවය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.
3. සේවායෝජකයින්ගේ කටයුතු වඩාත් පහසු කිරීමේ පියවරක් ලෙස සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචිය සිදු කරන A, B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (www.labourdept.gov.lk) ලබාගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව සේවායෝජකයින්ට මෙම A, B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා මාර්ගගතව සම්පූර්ණ කර භාගත කිරීමෙන් අනතුරුව කම්කරු දෙපාර්තමේන්තුවට එවීමෙන් සේවකයින් ලියාපදිංචි කළ හැකිය. එසේම, මෙමගින් A, B හා H පත්‍රිකා මුද්‍රණය සඳහා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව දරන පිරිවැය ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

4. කඩදාසි භාවිතය අවම කරමින් පිරිමැසුම්දායී සහ කඩිනම් අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස Slack යෙදවුම භාවිතය වර්ධනය කිරීම. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දැනුවත් කිරීම් කඩිනමින් දෙපාර්තමේන්තු නිලධරයින් අතරට ගෙනයමින් රාජකාරිමය අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස, කඩදාසි භාවිතය අවම කරමින් සහ තැපැල් පිරිවැය අවම කරමින් Slack යෙදවුම සාර්ථකව භාවිතා කරන රාජ්‍ය ආයතන අතරින් ප්‍රමුඛ ස්ථානයක් දෙපාර්තමේන්තුව හිමි කර ගෙන ඇත. එමෙන්ම ඒ හරහා RN සටහන් ලබා ගැනීම ඉතා කාර්යක්ෂමව සිදු කරනු ලැබේ.
5. කර්මාන්තශාලාවල සුරක්ෂිතතාවය ඉහල නැංවීමේ අරමුණින් 2022 වර්ෂයේ සිට සෑම කර්මාන්තශාලාවකම සුරක්ෂිතතා කමිටු පිහිටුවා එහි ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීමේදී මාර්ගගත ක්‍රමයට (https://sites.google.com/view/isd-dol/) ස්වයං විගණන වාර්තා එවීමේ පහසුකම ආයතන වෙත සලසා ඇත.
6. සේවක අර්ථසාධක අරමුදල් 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවශ්‍ය පොදු පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කර ඇතිදැයි යන්න කම්කරු කාර්යාල වෙතට පැමිනීමකින් තොරව මාර්ගගතව දැනගැනීමේ පහසුකම (https://forms.gov.lk/63a3cd4f6982f900132ce8af) සාමාජිකයින් වෙත සලසා දී ඇත.
7. කම්කරු දෙපාර්තමේන්තුවේ දෛනික කටයුතු වලදී මෙන්ම නඩු කටයුතු වලදීද අතවශ්‍ය වන සමාගම් ලියාපදිංචි සහතික හා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු ලබා ගැනීම සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත මාර්ගගත සේවාව (https://eroc.drc.gov.lk/) හරහා අංශ/කාර්යාල වෙත ලබා ගැනීම සිදු කරනු ලැබේ.
8. කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සාකච්ඡාමය කටයුතු සහ පුහුණු වැඩසටහන් සෞඛ්‍යාරක්ෂිත බව සහ ඉන්ධන භාවිතය අවම කිරීම සැලකිල්ලට ගනිමින් Zoom මාධ්‍ය මගින් පැවැත්වීම සිදු කරනු ලැබේ.

9. දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ් චැනලයක් (https://www.youtube.com/@labourdeptsl), ෆේස් බුක් පිටුවක් (https://www.facebook.com/labourdeptsl) සහ ට්විටර් ගිණුමක් (https://twitter.com/labourdeptsl) පවත්වාගෙන යමින් යාවත්කාලීනව තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. යූ ටියුබ් චැනලයෙහි සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන්, කාර්මික සම්බන්ධතාවයට අදාල නීතිමය තත්ත්වයන් පිළිබඳව, කාන්තාවන්, තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීමට අදාල නීතිමය තත්ත්වයන් සම්බන්ධයෙන් සහ ශ්‍රම ප්‍රමිතීන් සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කෙරෙන වීඩියෝ පට ඇතුලත් කර ඇත.

10. කම්කරු දෙපාර්තමේන්තුවේ නව වෙබ්අඩවියෙහි සංවර්ධන කටයුතු මේ දිනවල සිදු කරමින් පවතින අතර ඒ හරහා ඊ-සේවාවන් රාශියක් මහජනතාව වෙත ලබා දීමට සැලසුම් කර පවතී. එම ඊ-සේවාවන් අතුරින් කිහිපයක් සැකවින් පහත පරිදි වේ.

- සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ඉල්ලුම්පත්හි වර්තමාන තත්ත්වය මාර්ගගතව බලා ගැනීමේ හැකියාව ලබා දීම
- සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි වී ඇති සාමාජිකයින්ගේ තොරතුරු මාර්ගගතව බලා ගැනීමේ හැකියාව ලබා දීම
- සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින් හට තමන් සේවය කල ආයතන වසා අත්ද යන්න මාර්ගගතව පරික්ෂා කිරීමේ පහසුකම ලබා දීම
- කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබාගැනීම මාර්ගගතව සිදු කිරීම
- වෘත්තීය සමිති හා වෘත්තීය සමිති සම්මේලන ලියාපදිංචි කිරීම හා සම්බන්ධ ක්‍රියාවලීන් මාර්ගගතව සිදු කිරීම
- සංචාරක බංගලා සහ ශ්‍රවණාගාර මාර්ගගතව වෙන් කිරීම
- කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මඟින් සපයන දැනුවත් කිරීමේ වැඩසටහන් මාර්ගගතව ඉල්ලුම් කිරීමේ පහසුකම ලබා දීම
- මහජනතාව වෙත ස්වයංක්‍රීය පිළිතුරු ලබා දීමේ සේවාවක් (Chatbot) ඇති කිරීම